T: 1300 88 55 61
INTL: +61 3 95 10 96 61
translations@polaron.com.au
polaron.com.au
Suite 301/22-26 St Kilda Road,
St Kilda, VIC 3182, Australia
Polaron Language Services

| ENGLISH | SINHALESE/ සිංහල |
|---|---|
| **Background** | **පසුබිම** |
| Victoria is the first state in Australia to pass voluntary assisted dying laws. The ***Voluntary Assisted Dying Act (2017)*** provides a safe legal framework for people who are suffering and dying to choose the manner and timing of their death. | වික්ටෝරියාව ස්වකැමැත්තෙන් සහයැතිව මියයාම පිළිබඳ නීති සම්මත කළ ප්‍රථම ඔස්ට්‍රේලියානු ප්‍රාන්තය වේ. ***Voluntary Assisted Dying Act (2017)*** (ස්වකැමැත්තෙන් සහය ඇතිව මියයාම පිළිබඳ පනත (2017)) මගින් වේදනා විඳිමින් හා මියයමින් සිටින පුද්ගලයන්ට ඔවුන්ගේ මරණය සිදුවන ආකාරය හා කාලය තීරණය කිරීමට ආරක්ෂිත නෛතික රාමුවක් සපයයි. |
| With comprehensive safeguards and rigorous protections, the process for accessing voluntary assisted dying in Victoria will be the safest and most conservative in the world. | සවිස්තරාත්මක නීති මාලා හා හා දැඩි ආරක්ෂණයක් සහිතවන වික්ටෝරියාවේ ස්වකැමැත්තෙන් සහයැතිව මියයාම ඇගයීම ලෝකයේ ආරක්ෂිත ම හා සුපරික්ෂාකාරී ම  ක්‍රියාමාර්ගයක් වේ. |
| **What is voluntary assisted dying?** | **ස්වකැමැත්තෙන් සහයැතිව මියයාම යනු කුමක්ද?** |
| Voluntary assisted dying means administering a substance for the purpose of causing death in accordance with the steps and process set out in law. | ස්වකැමැත්තෙන් සහයැතිව මියයාම යනු, නීති මගින් සම්පාදනය කළ පියවර හා ක්‍රියාවලියවකට අනුව, මරණය ඇති කිරීමේ අරමුණින් රසායන ද්‍රව්‍යයක් ලබා ගැනීමයි. |
| Voluntary assisted dying must be voluntary and initiated by the person themselves, and it will usually be self-administered. Only those who are already dying from an incurable, advanced and progressive disease, illness or medical condition will be able to access voluntary assisted dying. | ස්වකැමැත්තෙන් සහයැතිව සිදුවන මියයාම ස්වේච්ඡාවෙන් මෙන් ම අදාළ පුද්ගලයා විසින් ම ආරම්භ කළ යුතු අතර, එය සාමාන්‍යයෙන් තමා විසින් ම සිදුකර ගනු ලබයි. සුව කළ නොහැකි, දරුණු හා උග්‍ර තත්ත්වයට පත්වන රෝග, අසනීප හෝ වෛද්‍යමය තත්ත්වයන් නිසා දැනටමත් මිය යමින් සිටින අයට පමණක් ස්වකැමැත්තෙන් සහයැතිව මියයාමට හැකියාව ලැබේ. |

T: 1300 88 55 61
INTL: +61 3 95 10 96 61
translations@polaron.com.au
polaron.com.au
Suite 301/22-26 St Kilda Road,
St Kilda, VIC 3182, Australia

| | |
|---|---|
| Voluntary assisted dying is only for those who face an inevitable, imminent death as a result of an incurable disease, illness or medical condition. | ස්වකැමැත්තෙන් සහායැතිව මියයාම කළ හැක්කේ සුව කළ නොහැකි රෝගයක්, අසනීපයක් හෝ වෛද්‍යමය තත්ත්වයක් නිසා නොවැලැක්විය හැකි, ආසන්නත ම මරණයක් අපේක්ෂාවෙන් සිටින අයට පමණි. |
| **Why is there a law?** | **නීතියක් ඇත්තේ ඇයි?** |
| Voluntary assisted dying is a process where an eligible individual (and only that individual) who is at the end of their life, and suffering, may choose the manner and timing of their death, after following steps set out in Victorian law. | ස්වකැමැත්තෙන් සහායැතිව සිදුවන මියයාම යනු, මරණය අභියස, පීඩා විඳිමින් සිටින සිටින එයට සුදුසුකම් ඇති අයෙක් (අදාළ පුද්ගලයා ම පමණක්) වික්ටෝරියානු නීති මගින් දක්වා ඇති ආකාරයට සිය මරණය ලඟා කර ගැනීමට අවශ්‍ය ආකාරය හා කාලය තෝරා ගන්නා ක්‍රියාවලියකි. |
| The law means that a person may be assisted by medical practitioners to access a substance to use to end their life at a time of their choosing. The process ensures the person's decision is voluntary and enduring and provides clear guidance for how medical practitioners can lawfully support the person in this choice. | නීතිය මගින් අදහස්වන ආකාරයට තමාට අවශ්‍ය වේලාවක මරණය ලඟාකර ගැනීමට අදාළ පුද්ගලයාට වෛද්‍යවරයකුගේ උපකාරය ලැබිය හැකිය. මෙම ක්‍රියාවලියේ දී අදාළ පුද්ගලයාගේ තීරණය ස්වේච්ඡාවෙන් ගෙන ඇති බව හා ස්ථිරබව තහවුරු කෙරෙන අතර, පුද්ගලයාගේ වරණයට වෛද්‍යවරුන් විසින් නීත්‍යානුකූලව උපකාර කළ හැක්කේ කෙසේද යන්න ගැන පැහැදිලි මාර්ගෝපදේශයක් සපයයි. |
| The law also provides a range of protections to make sure that voluntary assisted dying is safely implemented and monitored in Victoria. | වික්ටෝරියාව තුළ ස්වකැමැත්තෙන් සහායැතිව සිදුවන මියයාම ආරක්ෂිතව ක්‍රියාත්මක කෙරෙන හා අධීක්ෂණය කෙරෙන බව තහවුරු කර ගැනීමටත් නීති මගින් ආරක්ෂක ක්‍රියාමාර්ග සපයා තිබේ. |
| **Who is able to access voluntary assisted dying?** | **ස්වකැමැත්තෙන් සහායැතිව මියයාම තෝරා ගත හැක්කේ කාටද?** |

T: 1300 88 55 61
INTL: +61 3 95 10 96 61
translations@polaron.com.au
polaron.com.au
Suite 301/22-26 St Kilda Road,
St Kilda, VIC 3182, Australia

| | |
|---|---|
| Voluntary assisted dying is only for people who are suffering from an incurable, advanced and progressive disease, illness or medical condition, who are experiencing intolerable suffering. The condition must be assessed by two medical practitioners to be expected to cause death within six months. | සුව කළ නොහැකි,  දරුණු හා උග්‍ර තත්ත්වයට පත්වන රෝග, අසනීප හෝ වෛද්‍යමය තත්ත්වයන් නිසා දැරිය නොහැකි තරම් පීඩා විඳිමින් සිටින අයට පමණක් ස්වකැමැත්තෙන් සහහැතිව මියයාම අදාළ වේ. මෙම තත්ත්වය වෛද්‍යවරුන් දෙදෙනෙකු විසින්  ඇගයීමට ලක් කළ යුතු අතර, ඒ නිසා ඉදිරි මාස හය ඇතුළත මරණය සිදුවන බව අපේක්ෂා කළ යුතු වේ. |
| There is an exception for a person suffering from a neurodegenerative condition, where instead the condition must be expected to cause death within 12 months. | ස්නායුගත පරිහානිකර තත්ත්වයකින් පීඩා විඳින අයෙක් නම් ඉදිරි මාස 12 ඇතුළත මරණය සිදුවන බව අපේක්ෂා කළ හැකිය. |
| Voluntary assisted dying will only be available to Victorians who are over the age of 18 who have lived in Victoria for at least 12 months, and who have decision-making capacity. To be eligible for voluntary assisted dying they must be experiencing suffering that cannot be relieved in a manner the person considers tolerable. | ස්වකැමැත්තෙන් සහායැතිව සිදුවන මියයාම, අවුරුදු 18ට වැඩි වික්ටෝරියාවේ යටත් පිරිසෙයින් මාස 12ක් වත් ජීවත් වූ තීරණ ගැනීමේ හැකියාව ඇති වික්ටෝරියානු වාසීන්ට පමණක් අදාළ වේ. ස්වකැමැත්තෙන් සහායැතිව සිදුවන මියයාමට සුදුසුකම් ලැබීමට සිය පීඩා ඉවසිය හැකි තරම් සමනය කර ගැනීමේ නොහැකියාව අත්විඳ තිබිය යුතුය. |
| Mental illness or disability alone are not grounds for access to voluntary assisted dying, but people who meet all other criteria, and who have a disability or mental illness, will not be denied access to voluntary assisted dying. | මානසික රෝග හා ආබාධිතතා පමණක්, ස්වකැමැත්තෙන් සහායැතිව සිදුවන මියයාමට සුදුසුකම් නොවේ. කෙසේ වෙතත් සෙසු සියලු සුදුසුකම් සපුරා ඇති ආබාධිත හෝ මානසික රෝග සහිත අයටත් ස්වකැමැත්තෙන් සහායැතිව මියයාම සිදු කළ හැකිය. |
| **How will voluntary assisted dying work?** | **ස්වකැමැත්තෙන් සහායැතිව මියයෑම සිදුවන්නේ කෙසේද?** |
| Only the person wanting to access voluntary assisted dying may initiate discussions with health practitioners about voluntary assisted dying. | ස්වකැමැත්තෙන් සහායැතිව මියයාමට අවශ්‍ය පුද්ගලයන් ඒ සම්බන්ධයෙන් වෛද්‍යවරයා සමග කතා කිරීම ඇරඹිය යුතුය. |
| A family member or carer can't request voluntary assisted dying on somebody else's | වෙනත් අයකු වෙනුවෙන් ස්වකැමැත්තෙන් සහයැතිව මියයාම |

| | |
|---|---|
| behalf. This is to ensure that the request is completely voluntary and without coercion, and that the decision is the person’s own. | ඉල්ලා සිටීමට රැකවරණ සපයන්නකුට හෝ පවුලේ සාමාජිකයකුට නොහැක. ඉල්ලීම සම්පූර්ණයෙන් ම ස්වේච්ඡාවෙන් හා බලෙන් සිදු නොවන බව හා තීරණය අදාළ පුද්ගලයාගේ ම  බව තහවුරු කිරීම එහි අරමුණයි. |
| If a person wants to request access to voluntary assisted dying, they will need to be assessed by a suitably qualified doctor who will determine if the person is eligible. If the person is eligible, the process is repeated with a second doctor who will need to conduct another assessment. The doctors will make sure the person is making a fully informed decision and is aware of the available palliative care options. | යම් පුද්ගලයකුට ස්වකැමැත්තෙන් සහායැතිව මියයාමට අවශ්‍ය නම්, එම පුද්ගලයා එයට සුදුසු බව තීරණය කිරීමට අවශ්‍ය සුදුසුකම්ලත් වෛද්‍යවරයකුගේ ඇගයීමට ලක්විය යුතුය. අදාළ පුද්ගලයා සුදුසුකම් ලබන්නේ නම් දෙවැනි වෛද්‍යවරයකු ලවා නැවතත් ඇගයීමක් සිදුකර ගත යුතු වේ. පුද්ගලයා අවබෝධයෙන් යුතුව තීරණයක් ගන්නා බවත් පවත්නා සමනක රැකවරණ ගැන දැන සිටින බවත් වෛද්‍යවරු තහවුරු කර ගනිති. |
| If the person wishes to proceed, they will need to make a written declaration that is witnessed by two independent individuals, confirming that they are making an informed, voluntary and enduring decision to access voluntary assisted dying. | එම පුද්ගලයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කළහොත්, තමා අවබෝධයෙන් යුතුව, ස්වේච්ඡාවෙන් හා ස්ථිර වශයෙන් ස්වකැමැත්තෙන් සහායැතිව මියයාම සිදු කරන බවට ස්වාධීන පුද්ගලයන් දෙදෙනෙකු විසින් සාක්ෂි දරණ ලද ලිඛිත ප්‍රකාශයක් සිදු කළ යුතුය. |
| On receiving a final request, the doctor will apply for a permit to prescribe a substance that the person may use to end their life at a time of their choosing. The person must administer the substance themselves, unless they are physically unable to do so, in which case their doctor may assist. | අවසාන ඉල්ලීම ලැබීමෙන් පසු, පුද්ගලයාට තෝරාගත් වේලාවක සිය දිවි තොර කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍යයක් නියම කිරීමට අවසර පත්‍රයක් අයදුම් කිරීම වෛද්‍යවරයා විසින් සිදුකරයි. ශාරීරික වශයෙන් එසේ කිරීමට නොහැකි අවස්ථාවල දී හැර ද්‍රව්‍යය භාවිත කිරීම අදාළ පුද්ගලයා විසින් ම සිදු කළ යුතු අතර, එවන් අවස්ථාවල දී වෛද්‍යවරයා විසින් සහාය ලබා දෙනු ඇත. |
| No health practitioner or healthcare provider will be obliged to participate in voluntary assisted dying. | කිසි ම වෛද්‍යවරයකුට හෝ සෞඛ්‍ය සේවා සපයන්නෙකුට ස්වකැමැත්තෙන් සහායැතිව සිදුකරන මියයාමට සහභාගීවන ලෙස බල නොකෙරේ. |

T: 1300 88 55 61
INTL: +61 3 95 10 96 61
translations@polaron.com.au
polaron.com.au
Suite 301/22-26 St Kilda Road,
St Kilda, VIC 3182, Australia

| | |
|---|---|
| **Are there safeguards?** | **ආරක්ෂාව සළසන ක්‍රියාමාර්ග වේද?** |
| The process set out in the law includes many steps and safeguards to make sure that people are not being pressured to participate in the voluntary assisted dying process, and that it is completely voluntary. | ස්වකැමැත්තෙන් සහායැතිව මියයාම සිදු කිරීමට පුද්ගලයන්ට  බල නොකෙරෙන බවත්, ඔවුන් සිය කැමැත්තෙන් එය සිදුකරන බවත් තහවුරු කර ගැනීමට මෙම නීතියෙහි ක්‍රියාවලිය තුළ බොහෝ පියවර හා ආරක්ෂණ ක්‍රියාමාර්ග වේ. |
| The Voluntary Assisted Dying Review Board will monitor all activity under the law and will receive reports from all health practitioners who participate. The Board will make sure that the Act is being complied with and will also monitor substance permit applications. | Voluntary Assisted Dying Review Board (ස්වකැමැත්තෙන් සහායැතිව මියයාම පිළිබඳ සමාලෝචන මණ්ඩලය) මගින් නීතියට අදාළව සියලු කටයුතු අධීක්ෂණය කරන අතර සහභාගීවන සියලු වෛද්‍යවරුන්ගෙන් වාර්තා ලබාගැනීම සිදු කරයි. මණ්ඩලය මගින් පනතට අනුකූලව කටයුතු කෙරෙන බව තහවුරු කරන අතර ද්‍රව්‍ය අවසර අයදුම්පත් අධීක්ෂණය ද සිදු කරයි. |
| A person who is prescribed a voluntary assisted dying substance will also appoint a contact person so that any unused substance will be safely returned. | භාවිත නොකළ ද්‍රව්‍ය ආරක්ෂිතව ආපසු භාරදීම සඳහා ස්වකැමැත්තෙන් සහායැතිව මියයාමට ද්‍රව්‍ය නියම කරන පුද්ගලයා විසින් ඇමතිය හැකි වෙනත් කෙනෙක් පත් කරයි. |
| **When will voluntary assisted dying be available in Victoria?** | **වික්ටෝරියාවේ ස්වකැමැත්තෙන් සහයැතිව මරණයට පත්වීමට හැකි කවදා සිටද?** |
| The law comes into effect on 19 June 2019. After this date, people who meet the set of strict eligibility criteria will be able to request access to voluntary assisted dying. All people at the end of life will be supported to receive access to appropriate end of life care options. | නීතිය 2019 ජුනි 19 වැනිදා සිට බලපැවැත්වෙනු ඇත. මෙම දිනයෙන් පසු, දැඩි නිර්ණායකවලට අනුව සුදුසුකම් ලබන අයට ස්වකැමැත්තෙන් සහායැතිව මියයෑමට ඉල්ලා සිටිය හැකිය. ජීවිතයේ අග භාගයේ සිටින සියලු දෙනාට සුදුසු අන්දමේ ජීවිතාවසාන රැකවරණ තෝරා ගැනීම් හිමි වේ. |

| | |
|---|---|
| The Victorian Government is currently working to help health practitioners and health services prepare for providing voluntary assisted dying, including how to support those that choose to participate as well as those who conscientiously object. | ස්වකැමැත්තෙන් සහායැතිව මියයෑම සූදානම් කිරීමට දැනට වික්ටෝරියානු රජය වෛද්‍යවරුන් හා සෞඛ්‍ය සේවා සපයන්නන් සමග එක්ව කටයුතු කරමින් සිටින අතර, තෝරා ගන්නා පුද්ගලයන්ට හා හෘද සාක්ෂිය නිසා විරුද්ධවන අයට සහයෝගය ලබා දෙන්නේ කෙසේද යන්න මෙයට ඇතුළත් වේ. |
| **Support services** | **සහාය සේවා** |
| Some people may find issues relating to end of life care upsetting. If reading the material on this site or thinking about end of life care has raised some issues regarding grief and bereavement or personal crisis, the helplines below provide telephone support and counselling 24 hours a day, 7 days a week. Some services may also provide online assistance (depending on the service). | සමහර පුද්ගලයන්ට ජීවිතය අවසන් කිරීම පිළිබඳ ගැටලු තැවුල්කාරී විය හැකිය. මෙම වෙබ් අඩවියේ ඇතුළත් කරුණු කියවන විට හෝ ජීවිතය අවසන් කිරීම ගැන සිතන විට ශෝකය, වියෝවීම හා පෞද්ගලික අර්බුද මතුවන්නේ නම් පහත දැක්වෙන දුරකථන මාර්ග ඔස්සේ දින 7ම පැය 24 පුරා උපදේශන හා සහාය ලබා ගත හැකිය. සමහර සේවාවලින් මාර්ගගත සහාය ද ලබා දෙයි (සේවාව මත පදනම් වේ) |
| Australian Centre for Grief and Bereavement Tel. 1800 642 066 | Australian Centre for Grief and Bereavement (ශෝකය හා වියෝවීම පිළිබඳ ඔස්ට්‍රේලියානු මධ්‍යස්ථානය)<br><br>දුරකථන 1800 642 066 |
| Lifeline Tel. 13 11 14 | Lifeline (ලයිෆ්ලයින්) දුරකථන 13 11 14 |